| Form No. | | | | |
|---|---|---|---|---|
| III | I | TRG | 076 | 00 |

# සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය

**(1981 අංක 03 දරන පාර්ලිමේන්තු පණත යටතේ සංස්ථාපිතයි)**

## ලියාපදිංචි කිරීම, පාඨමාලා ගාස්තු සහ ගෙවීමේ ක්‍රමය

**1. පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම ඃ**

පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වීමට හැක්කේ නියමිත ලියාපදිංචි ගාස්තුව පාඨමාලාව ආරම්භ කිරීමට පෙර ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසුවය.

ලියාපදිංචි ගාස්තුව **ආපසු ගෙවනු නොලැබේ**.

**2. ලියාපදිංචි ගාස්තු ඃ**

ලියාපදිංචි ගාස්තුව පහත සඳහන් පරිදි වේ ඃ

කෙටි කාලීන පාඨමාලා (දින 07 / දින 12) රු.5,000/-

එක් වාර්ෂික පාඨමාලාව (Certified Supply Manager) - රු.10,000/-

ඩිප්ලෝමා පාඨමාලාව (GDPSCM) - රු.15,000/-

**3. පාඨමාලා ගාස්තු ඃ**

මෙම ගාස්තුවට ලියාපදිංචි කිරීමේ මුදලද ඇතුලත්ය.

ඒ ඒ පාඨමාලාවන් සඳහා අය කරන ගාස්තුව වෙන් වෙන්ව සඳහන්ව ඇත.

එම පාඨමාලා ගාස්තුව නියමිත දිනට හෝ ඊට පෙර ගෙවා නිම කලයුතුය.

**4. වාරික ගෙවීම ඃ**

කෙටි කාලීන පාඨමාලා සඳහා අදාල පාඨමාලා ගාස්තුව වාරික දෙකකින්, (ලියාපදිංචි ගාස්තුව හැර) කාල සටහනේ නියම කර ඇති පරිදි ගෙවිය යුතුය. අනෙකුත් පාඨමාලා සඳහා වාරික ගෙවීම් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අයදුම් කල යුතුය.

වාරික ගෙවීම් අවශ්‍ය වන ශිෂ්‍යයින් ඔවුන්ගේ අවශ්‍යතාවයන් දක්වා අයදුම්පතක් පුහුණු කිරීමේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කල යුතුය. අයදුම්පතක් කාර්යාලයෙන් ලබා ගත හැක. අයදුම් කරන්නාගේ අවශ්‍යතාවයන් සැළකීමෙන් පසු පුහුණු කිරීමේ අධ්‍යක්ෂගේ අභිමතය පරිදි වාරික ගෙවීම තීරණය වනු ඇත.

**5. නැවත ගෙවීම ඃ**

ගෙවන ලද පාඨමාලා ගාස්තුව (ලියාපදිංචි කිරීමේ ගාස්තුව හැර) කිසියම් සාධාරණ හේතුවක් මත නැවත ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ පළිබඳ ලිඛිත අයදුම්පතක් පුහුණු කිරීමේ අධ්‍යක්ෂ වෙත පාඨමාලාව ආරම්භ කර **සති තුනක් ඇතුලත** ඉදිරිපත් කලයුතුය. එවැනි අයදුම් පතක් සලකා බැලිය හැකි අතර ඉන් පසු ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**6. වෙනත් පාඨමාලාවකට මාරු වීම ඃ**

අවශ්‍යනම්, කරන ලද ගෙවීම් ආපසු ලබා නොගෙන පළමුව ලියාපදිංචි වූ පාඨමාලාව වෙනුවට එම මුදලට සරිලන වෙනත් පාඨමාලාවකට මාරුවීමට අවසර දිය හැක. මේ සඳහා කරුණු දක්වමින් පළමු ලියාපදිංචි වූ පාඨමාලාව ආරම්භ කිරීමෙන් **සති දෙකක් ඇතුලත** පුහුණු කිරීමේ අධ්‍යක්‍ෂ වෙත අයදුම් කල යුතුය. ඒ පිළබඳව සලකා බැලීම පුහුණු කිරීමේ අධ්‍යක්‍ෂ වෙත පැවරෙන අතර ඔහුගේ තීරණය අවසාන තීරණය වේ.

**7. අනුග්‍රාහක අයදුම්කරුවන් ඃ**

යම් අයදුම්කරුවෙක් ආයතනයකින් අනුග්‍රහය ලබන්නේ නම් ඔහු විසින් ආයතනයෙන් ලබා ගන්නා ලද ලිපියක් ඉල්ලුම්පත සමග ඉදිරිපත් කල යුතු අතර පාඨමාලාව අවසානයට පෙර එම ආයතනය පාඨමාලා ගාස්තුව ගෙවා නිම කරන බවට වග බලා ගත යුතුය.

**8. ගෙවීමේ ක්‍රමවේදය ඃ**

සියලු ගෙවීම් ලංකා බැංකුවේ, නිදහස් චතුරශ්‍ර ශාඛාවේ අංක 74668943 දරන ගිණුමට බැර කල යුතුය. මෙම ගෙවීම් තහවුරු කිරීම සඳහා එම ලදු පතේ පිටපතක් ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ පාඨමාලාවේ නම (සංකේතය) අදාල පුවත්පත් දැන්වීමේ හෝ ආයතනය විසින් නිකුත් කරන ලද දැන්වීමක දැක්වෙන පරිදි සඳහන් කොට පහත සඳහන් ලිපිනයට පුහුණු කිරීමේ අධ්‍යක්‍ෂ වෙත **පාඨමාලාව ඇරඹීමට පෙර** ලැබෙන්නට සැලැස්විය යුතුය.

**පුහුණු කිරීමේ අධ්‍යක්‍ෂ**
**සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය**
**අංක 275/75**
**මහාචාර්‍යය ස්ටැන්ලි විජේසුන්දර මාවත**
**කොළඹ 07,**

**ෆැක්ස් ඃ 0112584302**

පහත සඳහන් විස්තර පැහැදිලිව බැංකු ලදුපතේ සටහන් විය යුතුය ඃ

**ශිෂ්‍යයාගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය**

**පාඨමාලාවේ නම (සංකේතය)**

**9. ගෙවීම් පැහැර හැරීම ඃ**

සියලු ගෙවීම් නියමිත දිනට පෙර ගෙවා නිම කලයුතුය. එසේ කිරීමට අපොහොසත් වන ශිෂ්‍යයන් හට දේශන වලට / විභාගයට, සහභාගිවීමට ඉඩදෙනු නොලැබේ.

**10. වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අංකය අමතන්න ඃ**

සහකාර කළමණාකාරිනි / පුහුණු කිරීමේ අධ්‍යක්‍ෂ ඃ දු. අංක - 0112555562